ජූනි 08 මව්බිම මුල් පිටුවේ සිරස්තල ප්‍රවෘත්තියේ සඳහන් වූයේ, "සජිත්ට එරෙහි කුමන්ත්‍රණය අතේ පත්තු වී චම්පික දණින් වැටෙයි" යනුවෙනි. මෙහිදී පාඨලී චම්පික රණවක මන්ත්‍රීවරයා විසින් ව්‍යාජ ප්‍රවෘත්ති සහ වීඩියෝ දර්ශන නිර්මාණය කරමින් කුමන්ත්‍රණකාරී ව්‍යාපාරයක් ගෙන ගිය බව සඳහන්ව තිබිණි. මෙම පුවත් වාර්තාව සඳහා එකදු මූලාශ්‍රයක් හෝ සඳහන් වී නොතිබුණු අතර, එය ලියූ මාධ්‍යවේදියෙකුගේ නමක්ද සඳහන් වී නොතිබුණි.
මේ අතර, ජූනි 08 හිරු ප්‍රධාන පුවත් විකාශය ඔස්සේද, අද දෙරණ ප්‍රධාන පුවත් විකාශය ඔස්සේද මව්බිම සිරස්තල පුවත පෙන්වමින්, එහි දැක්වෙන චෝදනාව පිළිබඳව සඳහන් කර තිබිණි. කෙසේ වුවත්, එම අසත්‍ය පුවත් පැතිරවීමට පාඨලී චම්පික මන්ත්‍රීවරයා සම්බන්ධ දැයි සමගි ජන බලවේගයේ ප්‍රධාන විධායක අජිත් පී. පෙරේරාගෙන් විමසන විට, ඔහු එසේ නොවන බව සනාථ කරයි.
යම් කිසි ප්‍රවෘත්ති වාර්තාවක් පළ කිරීමේදී, එහි අඩංගු කරුණු වලට පදනම් වූ මූලාශ්‍ර හෙළිකිරීමට මූලාශ්‍රයෙන් අවසරයක් නොලැබෙන අවස්ථාවකදී, මූලාශ්‍රයේ අනන්‍යතාවය මාධ්‍යවේදියා විසින් ආරක්ෂා කළ යුතුවේ. නමුත් එවන් අවස්ථාවකදී පවා තමන් ඉදිරිපත් කරන කරුණු කාරණා ඔප්පු කිරීමට සාක්ෂි සාධක මාධ්‍යවේදියා සතුව තිබිය යුතුවේ. මෙසේ බලන විට, මෙම මව්බිම සිරස්තල පුවතට විශ්වසනීය මූලාශ්‍ර පාදක වී ඇතිද? ස.ජ.බ. ප්‍රධාන විධායක අජිත් පී. පෙරේරා විසින් මාධ්‍ය වෙත ප්‍රකාශ කරන ලෙසට එම සිරස්තල පුවත අසත්‍යයක් නම්, එය මව්බිම පසින් සිදුවූ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවේද?
ජූනි 08 රාත්‍රී 6.55 හිරු පුවත් විකාශයට සබැඳිය:
https://www.youtube.com/watch?v=dapK9gKMuCc&t=227s
ජූනි 08 අද දෙරණ 6.55 ප්‍රධාන පුවත් විකාශයට සබැඳිය:
https://www.youtube.com/watch?v=ghCZ5Svk77o&t=1466s
#MediaEthicsSL #lka #SinhalaNews #Mawbima